# පුරවැසි ක්‍රියාකාරින් සඳහා මූලික සන්නිවේදන තාක්ෂණය

**Basic Communications Technology for Citizen Activists**



# පුරවැසි ක්‍රියාකාරින් සඳහා මූලික සන්නිවේදන තාක්ෂණය

## හැඳින්වීම

'පුරවැසි ක්‍රියාකාරින් සඳහා මූලික සන්නිවේදන තාක්ෂණය' යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ත්‍රී භාෂා ප්‍රකාශනය කි. එය ගම් මට්ටමෙන් ක්‍රියාන්විතයට සම්බන්ද වන පුරවැසි ක්‍රියාකාරීන් හට අන්තර්ජාලය ඔස්සේ සන්නිවෙදනය කිරීමටත්, ජී මේල්, යුටුබ් සහ ෆේස්බුක් වැනී නව මාධ්‍ය භාවිතයට අඩිතාලම කි.

වර්තමානයේ සමාජ වේබ් අඩවි යොදගෙන කෙරෙන්නා වු බලපෑම් එල්ල කර හැකි ක්‍රියාකාරකම් ඉතා සරල ලෙසින් පැහැදිලි කරන්නට මෙම ප්‍රකාශනය ප්‍රයත්නයක් දරන්නේ, ක්‍රියාවලියට සම්බන්ද වන සහ සම්බන්ද වී සිටින ක්‍රියාකාරින් හට පහසුවෙන් තාක්ෂණය උපයොගි කරගෙන, තමන්ගේ ක්‍රියාකාරකම් නිසි ලෙස සංවිධානය කරගැනීමට ය. මෙයින් ඉතා එලදයි ප්‍රතිපල දැකගත හැකි වේ.

මෙම අත් පොතෙන් පඨකයා හට ජී මේල්, ෆේස්බුක්, වට්ස් ඇප් සහ වයිබර් යන තාක්ෂණ භාවිතා කිරීමට මනා අවබොධයක් ලබා දී අති අතර රියල් ටයිම් නම් යුනිකොඩ කන්වටරය භාවිතා කොට තමන් අන්තර්ජාලය ඔස්සේ සන්නිවේදනය කරන විට ඇති වන භාෂා ආශ්‍රිත බාධාක බිඳ දමා ක්‍රියකරන්නට ද සහයොගයක් වේ. තවද මෙම පොතේහි අඩංගු සෑම උපදෙසේම, අන්තර්ජාලයේ ප්‍රවේසම්ව කටයුතු කරන අන්දම පිළිබඳව ප්‍රමුඛතාවය දී ඇත.

www.citizenslanka.org වෙබ් අඩවිය සමග සම්බන්දතා ගෙන යන අන්දමද මෙහි පැහැදිලි කර තිබේ. එය පුරවැසි ක්‍රියාකරාරින් වෙනුවෙන් ත්‍රී භාෂාවෙන් පවත්වා ගෙන යන නව්ය වෙබ් අඩවියක් වන අතර එයින් ඔවුන් හට තොරතුරු දැන ගැනීමටත්, සන්නිවෙදනය කිරිමටත් හැකි වේ.

සම්පාදනය - ඩියගෝ සැම්සන්

# පටුන

පිටුව

**ජී මේල්** 03

ඊ මේල් එකක් යනු කුමක්ද?
ජී මේල් යනු කුමක්ද?
ජී මේල් ගිණුමක් තිබීමේ ප්‍රයෝජන මොනවාද?
ජී මේල් ගිණුමක් සාදා ගන්නේ කෙසේද?
ජී මේල්හි තිබෙන ඔබේ ඊ මේල් පණිවිඩ පිරික්සන්නේ කෙසේද?
ඊ මේලයක් තනන්නේ කෙසේද?

**ෆේස්බුක්** 08

ෆේස්බුක් යනු කුමක්ද?
ෆේස්බුක් හී නිතර සිදුවන ක්‍රියාකාරකම් මොනවාද?
ෆේස්බුක් ගිණුමක් සාදා ගන්නේ කෙසේද?
ඔබේ ගිණුම සකස් කර ගන්නේ කෙසේද?
ෆේස්බුක් පාවිච්චි කරන්නේ කෙසේද?
ෆේස්බුක් නිවේදනයන් බලන්නේ කෙසේද?
කණ්ඩායමකට සම්බන්ධ වන්නේ කෙසේද?
රසික පේජයක් සමඟ සම්බන්ද වන්නේ කෙසේද?

**වට්ස් ඇප් හා වයිබර්** 15

වට්ස් ඇප් හා වයිබර් යනු කුමක්ද?
මේවා දුරකතනයේ ස්ථාපිත කරගන්නේ කෙසේද?

**පුද්ගලිකත්වය හා ආරක්ෂාව** 16

පුද්ගලිකත්වය හා ආරක්ෂාව තහවුරු කරගැනීමේ ඇති වැදගත්කම කුමක්ද?
ඔබේ තොරතුරු සොරා ගැනෙන්නේ කෙසේද?
මෙවැනි අනතුරුවලින් අප අපව බේරාගන්නේ කෙසේද?
සමාජ වෙබ් අඩවි වල ඇති පුද්ගලික හා ආරක්ෂක අංග

**සිටිසන් ලංකා පරිශීලක අත්පොත** 27

සිටිසන් ලංකාහි හැඳින්වීම
වෙබ් අඩවියට පිවිසෙන්නේ කෙසේද?

**රියල් ටයිම් යුනිකොඩ කන්වටරය** 29
යුනිකොඩ කන්වටරයක් යනු කුමක් ද?
කන්වටරය භාවිතා කරන්නේ කෙසේ ද?

**ඇගයීම් පත්‍රය** 31

# ජී මේල්

## ඊ මේල් එකක් යනු කුමක්ද?

ඊ මේල් එකක් යනු අන්තර්ජාලය හරහා අප යවන ලිපියක් වැනි දෙයකි. මේ ඔස්සේ ලෝකයේ ඕනෑම තැනක සිට වඩාත් පහසුවෙන් තොරතුරු සන්නිවේදනය කළ හැකි ය.

## ජී මේල් යනු කුමක්ද?

ජී මේල් යනු අපට ඊ මේල් පණිවිඩ යැවීමට හෝ ලබා ගැනීම සඳහා නොමිලයේ ලැබෙන්නා වූ ඊ මේල් සේවාවකි.එය විවිධාකාර වෙබ් අඩවි වලට ඇතුළුවීම සඳහා හැඳුනුම්පතක් ලෙසද භාවිතා කරනු ලැබේ.


## ජී මේල් ගිණුමක් තිබීමේ ප්‍රයෝජන මොනවාද?

පළමුව අපට ඊ මේල් යැවීමටත්, මිනිසුන් සමඟ වඩා පහසුවෙන් සම්බන්ද වීමටත් හැකිවීම. එය සාමාන්‍යය ලිපි යවනවාට වඩා බොහෝ වේගයෙන් සිදුවන අතර පණිවිඩයක් යැවීමට ගත වන්නේ තප්පර කිහිපයක් වැනි ඉතා සුළු කාලයකි. සාමාන්‍යයෙන් ලිපියක් ලිඛිත ඔප්පුකරයක්ලෙස භාවිතයට ගන්නා නමුත් සන්නිවේදනය සඳහා ගත වන්නාවූ කාලය හේතුවෙන් ලිපි යවනවාට වඩා ඊ මේල් භාවිතා කිරීම වඩා එලදායි වේ.එමෙන්ම ඒවා ඔප්පුකරයන් ලෙස නීතියෙන්ද වලංගු වේ. ෆේස්බුක් ට්විටර් ඉන්ස්ටග්‍රෑම් හා එලකිරි වැනි බොහෝ වෙබ් අඩවි සඳහා ඊ මේල් ලිපිනයක් තිබීම අත්‍යාවශ්‍යය වන අතර සියලු වැදගත් යාවත්කාලීන (Update) කිරීම් හා වෙනස්කිරීම් ඊ මේල් ගිණුමේ ඉන්බොක්සය වෙත යැවේ.

## ජී මේල් ගිණුමක් සාදා ගන්නේ කෙසේද?

1. පළමුව ඔබ අන්තර්ජාලයට පිවිසීමට යොදා ගන්නා වෙබ් බ්‍රවුසරය විවෘත කර ගන්න. (උදා: ඉන්ටනෙට් එක්ස්ප්ලෝරර් හෝ ගුගල් ක්‍රෝම්) පසුව https://gmail.com ලෙස ටයිප් කර සර්ච් බටනය ක්ලික් කරන්න.

   ඔබට අගයන් දෙකක් පිරවීම සඳහා කොටු දෙකක් ඇති පේජයක් දක්නට ලැබේ. එහි ඇති පලමු කොටුවේ ඔබේ ජී මේල් ලිපිනය සඳහන් කළ යුතු වන අතර දෙවන කොටුවේ සඳහන් කළ යුතු වන්නේ ඔබේ ජී මේල් ගිණුමේ මුර පදයයි (Password) .මෙම කොටු දෙකට යටින් Create account නමින් සම්බන්දකයක් ඇත.



2. එම [Create account](#) නමැති සම්බන්දකය ක්ලික් කර එය තුළට පිවිසෙන්න.

3. පසුව ඔබට*Create Your Google Account*ලෙසින් අලුත් පේජයක් දක්නට ලැබේවී. ඔබේ සියලු පෞද්ගලික තොරතුරු මෙම පේජය මත පහත ආකාරයට සඳහන් කල යුතු වේ.


    - මෙහි **Name** ලෙස සඳහන් වී ඇති කොටසෙහි ඇති කොටු දෙකේ ඔබේ මුල් නම සහ අවසන් නම සඳහන් කළ යුතු ය.

    - ඊළඟට ඇත්තේ **Choose your user name** නම් කොටසයි. ඔබේ ඊ මේල් ලිපිනය ලෙස ගැනෙන්නේ මෙයයි.ව්‍යවහාරයේ පවත්නා පොදු නම් බොහොමයක් අනෙක් පරිශීලකයන් විසින් දැනටමත් තෝරාගෙන තිබෙන්නට හැකිය.

    - ඉතින් ඔබටම ආවේණික ලිපිනයක් සෑදීමට උත්සහ කරන්න. ඔබ තෝරා ගන්නා ලිපින දැනටමත් තෝරාගෙන තිබෙන ඒවා නම් එම පේජයේ මෙසේ දැක්වේවී.someone already has that username. Try another? එවිට එම ලිපිනයේ නම නැවත වෙනස් කර උත්සහ කරන්න. වෙනත් අය තෝරාගෙන නැති ලිපිනයක් හමුවනතුරු මෙම ක්‍රියාව සිදු කළ යුතුය.

    - පසුව තිබෙන්නේ **Password and confirm** නම් කොටසයි, එම වලංගු මුරපදය (Password) ලෙස අකුරු හා ඉලක්කම් දෙකම ඇති එකක් යොදා ගන්න. පසුව එම මුර පදයම confirm කොටසට යොදන්න.එය ගැලපෙන්නේ නැති නම් ඔබට එය යළි ඇතුළත් කරන්නට සිදුවේවී. ඔබගේ මුර පදය ආරක්ෂාකාරීව තියා ගන්නට වගබලා ගන්න. නැතහොත් ඔබට ඔබේ ගිණුම පාවිච්චි කිරීමට නොහැකි වේවී.


    - ඊළඟට තිබෙනා කොටස් කාණ්ඩය තුළ පහත තිබෙන ආකාරයට ඔබේ පෞද්ගලික තොරතුරු ඇතුලත් කිරීම සිදු කළ යුතුයි. උපන්දිනය, ස්ත්‍රී පුරුෂභාවය හා දුරකතන අංකය.




- ඔබට වෙනත් ඊ මේල් ලිපිනයක් නැති නිසා **Current email address** නම් කොටස ඒ ආකාරයටම හිස්ව තබන්න.

- ඊළඟට තිබෙන්නේ **CAPTCHA filed** නම් කොටසයි. මෙහිදී ඔබට දක්නට ලැබෙනා පින්තූරයේ තිබෙන වචන දෙක හෝ ඉලක්කම් ඒ ආකාරයටම ඇතුලත් කළ යුතුයි.

- අවසන් වශයෙන් කළ යුත්තේ Terms Of Service And Privacy Policy කියා තිබෙන තෝරාගැනීමේ කොටුව කියවා ක්ලික් කිරීමයි.





- ඊළඟ පේජයෙන් ඔබේ ඡායාරූපයක් අප්ලෝඩ් කිරීමට කැමතිදැය ඔබෙන් විමසාවී. ඔබ එයට අකමැති නම් next step මත ක්ලික් කරන්න.




- ඊළඟට ඔබේ ගිණුම ක්‍රියාත්මක වී ඔබව ජී මේල් වෙත සාදරයෙන් පිළිගැනේවී.


## ජී මේල්හි තිබෙන ඔබේ ඊ මේල් පණිවිඩ පිරික්සන්නේ කෙසේද?

පේජයේ වම්පස කෙළවර උඩින් තිබෙනා කාණ්ඩයන් තුලින් ඔබට වෙන වෙනම පිරික්සීම් සිදු කළ හැක. එම කාණ්ඩයන් මෙසේය. Inbox, Starred, Important, Sent mail, Drafts. එම කාණ්ඩයක් ක්ලික් කළ විට ඊට අදාල විස්තර පේජය මැදින් දිස්වේවී.





## ඊ මේලයක් තනන්නේ කෙසේද?

පේජයේ වම් කෙළවර උඩින් තිබෙනා **Compose** නම් රතු බොත්තම තෝරාගෙන එය ක්ලික් කරන්න. පසුව පේජය පහලින් දකුණුපස කෙළවරේ මේ ආකාරයේ කොටුවක් දිස්වේවී.




මෙහි “**To**” යනුවෙන් ඇති පළමු කොටුවේ සඳහන් කළ යුත්තේ ඔබ පණිවිඩය යැවීමට බලාපොරොත්තු වන තැනැත්තාගේ ඊ මේල් ලිපිනයයි.

පසුව ඔබේ ඊ මේලයේ මාතෘකාව “**Subject**”නම් කොටසෙහි සඳහක් කර ඊට යටින් ඇති කොටුවේ ඔබේ පණිවිඩය ටයිප් කරන්න. ඔබට බාහිර ඇමුණුමක් (attachment) කිරීමක් සිදු කිරීමට අවශ්‍යය නම් “**Attach**” ලෙසට ඇති අයිකනය තෝරාගෙන ඒ හරහා ඔබ කැමති ඇමුණුම කිරීම තෝරාගත හැකිය. අවසානයට send බොත්තම ක්ලික් කරන්න.




**Attach Button**

ඔබට ඇමිණිය හැක්කේ මෙගාබයිට් 25ට අඩු ෆයිල බව මතක තබා ගන්න.

**සුරක්ෂිතභාවය පිණිස**

- ඔබේ ඊ මේල් ලිපිනයත් සමඟ මුරපදය අන් අයට දීමෙන් වලකින්න.
- ඔබ නොදන්නා පුද්ගලයන් විසින් එවන ලද ඊ මේල් පණිවිඩ විවෘත කිරීමෙන් වළකින්න.
- ඔබ ඉන්ටනෙට් කැෆේ එකක තිබෙන පොදු පරිගනකයකින් ඔබේ ඊ මේල් ගිණුම වෙත පිවිසුනහොත් ඔබේ මුර පදය එහි save නොකිරීමට වගබලා ගන්න.

# ෆේස්බුක්

## ෆේස්බුක් යනු කුමක්ද?


ෆේස්බුක් යනු ඔබට ඔබේ යහළුවන් හා අනෙකුත් පුද්ගලයින්  සමඟ නිරන්තරයෙන් සම්බන්ධ වී සිටිය හැකි සමාජ ජාල වෙබ් අඩවියකි. මෙය බොහෝ තොරතුරු සන්නිවේදනය කළ හැකි නව මාධ්‍යයකි.

## ෆේස්බුක් හී නිතර සිදුවන ක්‍රියාකාරකම් මොනවාද?

- පින්තූර, වීඩියෝ හා ස්ටේටස් අප්ලෝඩ් කිරීම
- මිතුරන් සමඟ පණිවිඩ හුවමාරුව
- ෆේස්බුක්හි ඇති නොයෙකුත් දේ පිළිබඳව කමෙන්ටු හා ලයික් දැමීම
- පරිගණක ක්‍රීඩා සෙල්ලම් කිරීම, ප්‍රහේලිකා වලට පිළිතුරු සැපයීම සහ කණ්ඩායම් වලට හෝ රසික පේජ වලට සම්බන්ද වීම
- නොයෙකුත් ව්‍යාපාරයන් හී සාමාජිකත්වය ගැනීම
- ජාලයන් හී තිබෙන තොරතුරු බෙදා ගැනීම

## ෆේස්බුක් ගිණුමක් සාදා ගන්නේ කෙසේද?

1. පළමුව ඔබේ වෙබ් බ්‍රවුසරය විවෘත කර ගන්න.
2. ඊළඟට https://facebook.com ලෙස ටයිප් කර search බොත්තම ක්ලික් කරන්න.





3. මුල් පේජයේ තිබෙන හිස් කොටු සියල්ල පුරවා ඒවාට යටින් දකුණු පැත්තට වන්නට තිබෙන **Sign Up** බොත්තම ක්ලික් කරන්න. මෙහිදී ඔබ යොදන ඊ මේල් ලිපිනය ඊළඟ වාරයේදී ඔබ ඔබේ ෆේස්බුක් ගිණුමට පිවිසෙන විට හඳුනාගැනීමේ කේතයක් ලෙසභාවිත වේ.
4. මීලඟට ඔබේ ගිණුම තහවුරු කර ගැනීමේ ඊ මේලයක් ඔබ සඳහන් කළ ඊ මේල් ලිපිනය වෙත යැවෙනු ඇත. පසුව ඔබ ඔබේ ඊ මෙල් ගිණුමට පිවිස එහි ඉන්බොක්සය පිරික්සීමේදී click to confirmලෙස සම්බන්දකයක් තිබෙනු ඇත. එය ක්ලික් කරන්න.


5. ඊට පසු ඔබ කැමති ආකාරයට ඔබේ ගිණුමේ තොරතුරු හා පින්තූර වෙනස් කිරීම සඳහා ඔබව ඔබේ ෆේස්බුක් ගිණුම වෙත යොමු කෙරෙනු ඇත.

## ඔබේ ගිණුම සකස් කර ගන්නේ කෙසේද?

- ගිණුමට ඔබේ පින්තූරයක් දැමීම සඳහා upload a profile pictureනම් තීරය ක්ලික් කරන්න.(මෙය පොදුවේ ඕනෑම අයෙක්ට දර්ශණය වන නිසා පරෙස්සම් වන්න.)





- ෆේස්බුක් හී search bar මත ඔබේ යහළුවන්ගේ නම් ටයිප් කර ඔවුන් ඔබේ මිතුරන් ලෙස add කර ගත හැකිය.
  **(ඩියෝ,** මෙතන search bar එක මත මිතුරෙකු සොයා ගන්නා ආකාරය රූප සටහනකින් පෙන්වන්න.)




## ෆේස්බුක් පාවිච්චි කරන්නේ කෙසේද?


- ස්ටේටස් එකක් යාවත්කාලීන (Update) කිරීම.





- ෆේස්බුක්හි කතාබස් කිරීමට ඔබේ ගිණුමට ඔබේ යහළුවන් ඇතුළත් කරගෙන තිබිය යුතුයි.




- ඔබේ ජාලයේ සිටින මිතුරන් හා අනෙක් අය උනන්දුවක් දක්වන අවස්ථාවල පින්තූර ඇතුලත් කරන්නේ පහත ආකාරයට වේ.




- ඔබට වීඩියෝ දර්ශණද පහත ආකාරයට ෆේස්බුක් අඩවියට ඇතුලත් කළ හැකි ය. මෙය ඔබේ පින්තූර ඇතුළත් කිරීම සඳහාද තවත් එක් විදිහකි.





1. පළමුව News Feed තීරය ක්ලික් කරන්න.
2. පසුව **AddPhotos/Videos** ක්ලික් කරන්න.
3. මීළඟට රූපයේ දැක්වෙන ආකාරයට එකතු කිරීමේ ලකුණ මත ක්ලික් කරන්න.
4. පසුව විවෘත වන වින්ඩෝවෙන් ඔබේ පරිගණකය තුළ තිබෙන ඔබ කැමති පින්තූරයක් හෝ වීඩියෝ දර්ශණයක් තෝරා ගැනීමට හැකිය.
5. අවසානයට **Post** බොත්තම ක්ලික් කරන්න.

## ෆේස්බුක් නිවේදනයන් බලන්නේ කෙසේද?


- Friend Requests – මෙය ක්ලික් කිරීම මඟින් ඔබට ඔබේ යහළුවන් වීම සඳහා අයදුම් කර ඇති අයව දැකගත හැකි වේ. ඔබට ඔවුන්ගේ ගිණුම් වෙත ගොස් ඒවා පිරික්සා ඔවුන්ව යහළුවන් කර ගන්නවාද නැද්ද කියා තීරණය කළ හැකි ය. ඔබේ පෞද්ගලික යාවත්කාලීන (Update) කිරීම් දැකගත හැකිවන නිසා නන්නාඳුනන අය ඔබේ ගිණුමට එකතු කර ගැනීමේදී පරෙස්සම් වන්න.




- Inbox Messages – මෙහි ඇත්තේ ඔබේ ගිණුමට සජීවී ලෙස සම්බන්ද වී ඇති හා නැති මිතුරන් විසින් ඔබට එවන ලද පණිවිඩ වේ. ඔබේ මිතුරා හෝ මිතුරිය එම මොහොතේ ඔබ හා සජීවීව සම්බන්ද වී සිටියේ නැතත් ඔබට ඔහුගේ හෝ ඇයගේ නම ටයිප් කර එම කෙනාට පණිවිඩයක් යැවීම සිදුකල හැකිය. එලෙසින් ම ඔබ සජීවීව සම්බන්ද වී නැති මොහොතවල් වල ඔබේ මිතුරන්ටද ඔබට පණිවිඩ එවීම සිදු කළ හැකිය.




- General Notifications– ඔබට ඔබේ මිතුරන් විසින් ලයික් කරන ලද, කමෙන්ට් කරන ලද හා ශෙයා කරන ලද සියලුම තොරතුරු දිස්වන්නේ මෙම තීරයෙනි. තවද ක්‍රීඩා සඳහා කැඳවීම් හා රසික පේජ සඳහා ආරාධනා ද මෙම තීරුවෙන් දැක්වේ




# ෆේස්බුක් පේජ හා කණ්ඩායම්

## කණ්ඩායමකට සම්බන්ධ වන්නේ කෙසේද?


1. search bar වෙත ගොස් ඔබට සම්බන්ද වීමට අවශ්‍යය කණ්ඩායමේ නම සඳහන් කරsearchඅයිකනය ක්ලික් කරන්න.ඔබ ටයිප් කරන ලද නමට සමාන නම් ඇති කණ්ඩායම් ලැයිස්තුවක් ඔබ ඉදිරියේ දර්ශණය වේවී.එම කණ්ඩායමක නම ක්ලික් කිරීම මඟින් එහි අන්තර්ගතය බලා ගත හැකිය.





2. සමහරක් කණ්ඩායම් නිර්මාණය කර තිබෙන්නේ එක්තරා පිරිසකට පමණි. Closed group ලෙසින් හැඳින්වෙන ඒවාට සම්බන්ධ විය හැක්කේ ඒවායේ අයිතිකරුවන් විසින් ඔබට ආරාධනයක් සිදු කළහොත් පමණි.




3. ඔබට විවෘත කණ්ඩායමකට සම්බන්ද වීමට අවශ්‍යය නම්, ඔබ එම කණ්ඩායමේ පේජය මත තිබෙන කොළ පැහැති **Join Group**නම් බොත්තම ක්ලික් කල යුතුයි. (ඔබට අදාල නැති කණ්ඩායම් වලට සම්බන්ද වීමේදී පරෙස්සම් විය යුතු වන්නේ නන්නාඳුනන පුද්ගලයින්ට එම කණ්ඩායම හරහා ඔබේ ගිණුමට යම්තාක් දුරකට ඇතුළත් විය හැකි බැවිනි.)




4. කණ්ඩායමක් මත පෝස්ට් දැමීම ඔබ සාමානයයෙන් ෆේස්බුක් ජාලය මත පෝස්ට් දමන ආකාරයට සමාන වේ. ඔබට ඔබ කැමති දෙයක් ලියා අප්ලෝඩ් කිරීමේ හැකියාවක් ඇත.එහෙත් ඔබේ කණ්ඩායම් සාමාජිකත්වය කණ්ඩායමේ අයිතිකරු විසින් තහවුරු කරන තෙක් බලා සිටීමට ඔබට සිදුවෙනු ඇත. (අනවශ්‍යය දේ හා මාතෘකාවට අදාල නොවන දේ එම කණ්ඩායම් මත පෝස්ට් නොකරන්න මන්දයත් එසේ සිදු කිරීම ඔබව එම කණ්ඩායමෙන් ඉවත් කිරීමට හේතුවක් විය හැකිය.)





5. ඔබේ කණ්ඩායම් වල සියලු යාවත්කාලීන කිරීම් news feed තීරුව යටතේ දිස්වේවී.එසේම ඔබ කැමති නම් එම කණ්ඩායමේ නම නැවත search bar මත සඳහන් කර එය තුළට පිවිසිය හැකිය.




## රසික පේජයක් සමඟ සම්බන්ද වන්නේ කෙසේද?

1. search bar වෙත ගොස් ඔබ සම්බන්ද වීමට කැමති රසික පේජයේ නම සඳහන් කරන්න. කලින් ඔබ කණ්ඩායම් සෙවීම සිදු කරද්දී පැමිණි ආකාරයටම ඔබ ඇතුලත් කරන ලද රසික පේජයේ නමට සකස් කර ඇති ලැයිස්තුවක් ඔබ ඉදිරියේ දර්ශණය වේවී.




2. ඔබ සම්බන්ධ වීමට කැමති පේජයේ නම මත ක්ලික් කරන්න.එසේ නොමැති නම් කෙලින්ම රසික පේජයේ දකුනු පසට වන්නට තිබෙන join the fan page බොත්තම් මත ක්ලික් කරන්න. එසේ ක්ලික් කිරීමෙන් ඔබව රසික පේජයේ ටයිම්ලයිනය වෙතට යොමු වෙනු ඇත.



# වට්ස්ඇප් හා වයිබර්


## වට්ස් ඇප් හා වයිබර් යනු කුමක්ද?


මේවා අන්තර්ජාලය හරහා ඉතා ඉක්මණින් හා අඩු මුදලකට පණිවිඩ හුවමාරු කර ගැනීම පිණිස සකස් කරන ලද ජංගම දුරකතන මෘදුකාංගයන් වේ.

**වැදගත් – මෙම මෘදුකාංග ඇතුලත් කල හැක්කේ ඒවායේ පද්ධතියට ගැලපෙන ජංගම දුරකතන වල පමණක් වන අතර අන්තර්ජාල සම්බන්දතාවය ඔස්සේ දුරකතනයට මෙම මෘදුකාංග බාගත කරගෙන ස්ථාපිත කරගැනීමෙන් ඒවා පාවිච්චි කළ හැකිය.**

## මේවා දුරකතනයේ ස්ථාපිත කරගන්නේ කෙසේද?


- ඔබ ඇන්ඩ්‍රොයිඩ් වර්ගයේ දුරකතනයක් පාවිච්චි කරන්නේ නම් Play Store වෙත ගොස් search කිරීමෙන් ඔබට මේවා බාගත කර ගත හැකිය. (ඊට පිවිසීමේදී ඔබේ ජීමේල් ගිණුමේ විස්තර ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටියොත් ඔබගේ ඊමේල් ලිපිනය හා මුරපදය (Password) ඇතුළත් කරන්න).
- ස්ථාපිත කිරීම සම්පූර්ණ වූ පසු මෘදුකාංගය විවෘත කර ගන්න.දැන් තහවුරු කරගැනීමක් සඳහා ඔබගේ දුරකතන අංකය ඇතුළත් කළ යුතුය.




- ඊලගට ඔබේ දුරකතනයට කෙටි පණිවිඩයක් ලෙස කේතයක් ලැබේවී.එය පිටපත් කරගෙන ඔබේ වට්ස්ඇප් හෝ වයිබර් මෘදුකාංගයට ඇතුලත් කිරීමෙන් පෙර කීතහවුරු කිරීම පරිපූර්ණත්වයට පත් වේ.
- අවසානයට මෘදුකාංගය විවෘත කර බැලූ විට ඔබේ දුරකතන නාමාවලියට ඇතුළත් කර තිබෙන පුද්ගලයන්ද එම මෘදුකාංග භාවිත කරන්නන් වේ නම් ඔවුන් වෙන වෙනම දර්ශනය වේවී.





- එම මෘදුකාංග ඔස්සේ සජීවී ලෙස සම්බන්ධ වී සිටින පුද්ගලයන් හා ඔබට කෙටි පණිවිඩ,හඬපට,පින්තූර හා වීඩියෝ පට හුවමාරු කර ගත හැකි අතර අන්තර්ජාල සම්බන්දතාවය හරහා ඇමතුම් ලබා ගැනීමටත් හැකියාව ඇත.

# පුද්ගලිකත්වය හා ආරක්ෂාව

## පුද්ගලිකත්වය හා ආරක්ෂාව තහවුරු කරගැනීමේ ඇති වැදගත්කම කුමක්ද?



අන්තර්ජාලය භාවිතා කිරීමේදී නිසියාකාර ලෙස පුද්ගලිකත්වය හා ආරක්ෂාව ගැන සැලකිලිමත් විය යුතු වන්නේ ඕනෑම අයෙක්ට අන්තර්ජාලය විවෘත දෙයක් වන නිසා පිටස්තරයන් විසින් ඔබේ වැදගත් දත්තයන් සොරා ගැනීමේ හෝ නොමනා ලෙස භාවිත කිරීමේ අවධානමක් පවතින බැවිනි.

## ඔබේ තොරතුරු සොරා ගැනෙන්නේ කෙසේද?

- ඔබගේ තොරතුරු කලමනාකරණය යම්කිසි නරක දෙයක් සිදුවන තුරු ඒ තරම් වැදගත් නොවන්නට පුළුවන්.ෆේස්බුක්හි ඇති පින්තූර, නම් හා පෞද්ගලික තොරතුරු වංචාකාරී ලෙස ලබාගෙන ඒවායේ සැබෑ අයිතිකරුවන්ගේ නමට කැළලක් ඇති වන ආකාරයෙන් භාවිතා කිරීමේ සිද්ධි ඕනෑතරම් වාර්තා වී තිබේ. හැකර්ස් ලෙසට හැඳින්වෙන සයිබර් හොරුන් විසින් ඔබේ පෞද්ගලික තොරතුරු ලබාගෙන ඔබව අවමාන තර්ජනයට ලක් කිරීමේ හැකියාව පවතී.
- මෙම සයිබර් හොරුන් අන්තර්ජාලය ඔස්සේ සජීවී ලෙස ක්‍රෙඩිට් කාඩ් මඟින් භාණ්ඩ මිලදී ගන්නා අයවලුන්ගේ ක්‍රෙඩිට් කාඩ්පත් වල විස්තර කී ලොගර්ස් හා ව්‍යාජ පේජ වැනි විවිධාකාර ක්‍රමෝපායන් යොදාගෙන සොරා ගනු ලබයි. එසේ සොරා ගන්නා විස්තර භාවිතා කර වෙනත් ගිණුම් ඔස්සේ නොයෙකුත් දෑ ඔවුන් මිලදී ගත් විට එම මිලදී ගත් භාණ්ඩ වල බිල් ගෙවීමට සිදුවන ක්‍රෙඩිට් කාඩ්පත් හිමියා ඉන් ඉතා අසරණභාවයට පත් වේ.
- තවද මෙම සයිබර් හොරුන් විවාධාකාර වයිරස අන්තර්ජාලයේ පතුරවා හරිමින් ඒවා හරහා සයිබර් ප්‍රහාර සඳහා අන්තර්ජාලය ඔස්සේ පරිගණක තුළට රහසින් පිවිසෙන බවත්බොහෝ අවස්ථාවලදී තමන්ගේ පරිගණකය මෙම බරපතල සයිබර් අපරාධ සඳහා යොදා ගැනෙන බවත්ඒවායේ අයිතිකරුවන් පවා දැන සිටින්නේ නැත.එබැවින් මෙවැනි හොරුන්ගෙන් ආරක්ෂා වීම සඳහා ඔබගේ පරිගණක උපාංග වල ආරක්ෂාව තහවුරු කර තිබීම ඉතා වැදගත් වේ.
- ඔබ දැනගත යුතු තවත් කරුණක් වන්නේ මෙම සයිබර් අපරාධ සිදුකිරීමටත් නීතිය නොමඟ යැවීමටත් මෙම හොරුන්ට ඔබගේ පෞද්ගලික තොරතුරු භාවිත කල හැකි බවයි.අවසානයේ ඔබ එවන් ක්‍රියා නිසා බොහෝ අපහසුතාවයට පත්වීමට ඉඩ ඇත.
- විශේෂයෙන්ම කාන්තාවන් හා ගැහැණු ළමුන් අන්තර්ජාලය ඔස්සේ තමන්ට සමීප වීමට තැත් කරන නොදන්නා නොඅඳුනන පුද්ගලයන් ගැන වඩා පරෙස්සම් විය යුතු අතර ඔවුන් හා මිත්‍රත්වයක් ගොඩනැගීමේදී හෝ තමන්ගේ පුද්ගලික තොරුතුරු හුවමාරුවේදී බොහෝ සැළකිලිමත් විය යුතු වේ.මේවා ගැන නොසැලකිලිමත් විම නිසා සිදුවන සිදුවීම් අද මාධ්‍යයෙන් නිරතුරුවම වාර්තා කරනු දැකීමට හැකිය. ඔබට එදිනෙදා ජීවිතයේ හමුවන නන්නාඳුනන අමුත්තන් හා ගණුදෙනු කරන ආකාරයට කිසිම විටකදී ඔවුන්ට ඔබේ පෞද්ගලික තොරතුරු ලබා දීමෙන් වැළකී සිටින්න.

## මෙවැනි අනතුරුවලින් අප අපව බේරාගන්නේ කෙසේද?


මෙවැනි අනතුරු වලින් බේරී සිටිමට අපට අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙතක් ඇත.

- නොදන්නා වෙබ් අඩවි මත ඔබේ පෞද්ගලික තොරතුරු ඇතුළත් කිරීමෙන් වලකින්න.
- ප්‍රචාරක දැන්වීම් ලෙස අන්තර්ජාලයේ තිබෙන සම්බන්දකයන් මත ක්ලික් කර සිටීමෙන් වලකින්න.
- ෆේස්බුක්, ට්විටර් වැනි සමාජ වෙබ් අඩවි වලට නොදන්නා අය එකතු කර ගැනිමෙන් වලකින්න.
- නොදන්නා ෆයිල් වර්ග අන්තර්ජාලයෙන් බාගත කිරීමෙන් වලකින්න.
- තත්වයෙන් උසස් වයිරස් ගාඩයක් බාගත කරගෙන පරිගනකය තුළ ස්ථාපිත කර ගන්න.
- පරිගනකයට ඇතුල් කෙරෙන සී ඩී තැටි,පෙන් ඩ්‍රයිව්ස්,හාඩ් ඩිස්ක් හා මෙමරි චිප් ආදිය වයිරස් ගාඩය හරහා ස්කෑන් කර ඇතුලත් කරන්න.


## සමාජ වෙබ් අඩවි වල ඇති පුද්ගලික හා ආරක්ෂක අංග

## ගූගල්

- ඔබේ බ්‍රවුසරය විවෘත කර ගන්න, Google search barවෙත ගොස්**Google 2 step setup** ලෙස ටයිප් කරන්න.
- පහත දැක්වෙන **Turn on 2-Step Verification** සම්බන්ධකය මත ක්ලික් කරන්න.





- දැන් පහත දැක්වෙන ආකාරයට 2-Step verification නම් සම්බන්ධකය මත ක්ලික් කරන්න.





- ඊළඟට විවෘත වන පේජයේ දකුණුපස කෙළවරට වන්නට තිබෙන Start setup නම් බොත්තම මත ක්ලික් කරන්න.

- ඒ මත ඉල්ලා තිබෙන තොරතුරු ලබා දී එය පුරවන්න.
- ඔබේ දුරකතන අංකය නිවැරදිව ඇතුලත් කර send codeනම් බොත්තම මත ක්ලික් කරන්න.




- ඔබ ඇතුලත් කෙරූ දුරකතන අංකයට කේතයක් (Code) ලැබේවී.ඔබේ දුරකතනය පිරික්සා බලා එම කේතය නිවැරදිව ඊලඟට විවෘත වන පේජය මත සඳහන් කරන්න. දැන් verify මත ක්ලික් කරන්න.





- ඔබ දැන් භාවිතා කරන පරිගනකය විශ්වාසි එකක් නම් කුඩා කොටුව මත ක්ලික් කර ඊලඟට විවෘත වන පේජයේ next මත ක්ලික් කරන්න.
- දැන් Confirm බොත්තම මත ක්ලික් කරන්න.දැන් ඔබේ ගුගල් ගිණුම ආරක්ෂිතයි. ඔබ අලුත් පරිගනකයකින් ඔබේ ගිණුම වෙත පිවිසෙන සෑම අවස්ථාවකදීම ඔබේ ගිණුමට තහවුරු කෙරූ දුරකතන අංකයට පිවිසීමේ කේතයක් ලැබේවි.

## ෆේස්බුක්


- ෆේස්බුක් හීදී ඔබ කෙතරම් පුද්ගලිකත්ව සැකසුම් සිදු කලත් ඔබේ දත්තයන් 100% ක් පුද්ගලික වන්නේ නැත.එහෙත් ඔබට සරල ක්‍රමෝපායන් කිහිපයක් භාවිතා කර ඔබේ පෞද්ගලික තොරතුරු දකින්නන් පාලනය කළ හැකිය.
- ඔබ ඔබේ ෆේස්බුක් ගිණුමේ දමන දෑ නැරඹිය හැකි අය මේ ආකාරයට තෝරා ගන්න.




- ඔබේ දත්තයන් සුරක්ෂිත කිරීමට ආරක්ෂාකාරීම ආකාරය වන්නේ **Only Me** නම් සැකසුම තෝරා ගැනීමයි.එවිට ඔබ පලකරන දෑ දැකගත හැකිවන්නේ ඔබටම පමණි. ඔබට අනෙක් පුද්ගලයින්ද ඔබ පලකරන දෑ දැකගැනීම අවශ්‍යය නම් **Friends** නම් සැකසුම තෝරාගන්න**.** එවිට ඒවා දැකගත හැක්කේ ඔබ යහළුවන් ලෙස ඔබේ ගිණුමට ඇතුලත් කර සිටින අයට පමණි.ඔබ **Public** නම් සැකසුම තෝරා ගත් විට ෆේස්බුක් හී සිටින ඕනෑම අයෙක්ට ඔබ පලකරන දෑ දැකගත හැකිවනු ඇත.
- ඔබේ පුද්ගලිකත්ව හා ආරක්ෂක සැකසුම් සැකසිය හැකි වඩා සංකීර්ණ වූ ආරක්ෂක ක්‍රමවේදයක් ද ඇත.මේ සඳහා ඔබ ෆේස්බුක් හී **Privacy settings and tools** නම් පේජයට පිවිසිය යුතුය.
- දැන් ඔබේ ෆේස්බුක් පේජයේ දකුණුපස කෙළවර ඉහලින් තිබෙන ඊතලය මත ක්ලික් කරන්න. එවිට පහත පින්තූරයේ ආකාරයට ලැයිස්තුවක් පහලින් දිස්වනු ඇත. එහි settings නම් තීරුව මත ක්ලික් කරන්න.




- ඊළඟට දිස්වන පේජයේ වම් පසින් ඇති Privacy නම් තීරුව මත ක්ලික් කළ යුතුය.





- ඉහත තිබෙනා සැකසුම් ඔබට ගැලපෙන ආකාරයට තෝරාගත හැකිය. තෝරාගත හැකි හොඳම හා නිර්දේශිත සැකැස්ම වන්නේ**Only Friends**නම් සැකැස්මයි.
- දැන් එම පේජයේම තිබෙන**Security** නම් තීරුව මත ක්ලික් කරන්න. දැන් ඔබට පහත දැක්වෙන ආකාරයට ඔබේ ගිණුමේ ආරක්ෂක තත්වයන් සැකසීම සිදු කළ හැකිය.


**ලොගින් ඇලට්ස් හෙවත් පිවිසුම් නිවේදන**

❖ මෙය ක්‍රියාත්මක කිරීම තුලින් ඔබ හෝ වෙනත් ඕනෑම අයෙක් ඔබේ ගිණුම වෙත පිවිසුන විටදී ඔබට නිවේදනයක් ලැබෙනු ඇත.




## ලොගින් අපෘවල්ස් හෙවත් පිවිසුම් අනුමත කිරීම








- ❖ get startedබොත්තම මත ක්ලික් කර ඔබේ දුරකතන විස්තර ඇතුලත් කළ පසු ඔබට කෙටි පණිවිඩක් ලෙස කේතයක් ලැබේවී.






- ❖ එය ඉහත කොටුවේ ඇතුලත් කර continueනම් බොත්තම මත ක්ලික් කරන්න.

❖ මෙය ඔබේ ගිණුමට පිවිසීමට නොහැකි වූ විට අනුගමනය කළ යුතු පූර්වාරක්ෂක උපක්‍රමයකි.




❖ නිල් පැහැති සම්බන්ධකය මත ක්ලික් කර **Choose trusted contacts**නම් බොත්තම මත ක්ලික් කරන්න.





❖ ඔබේ විශ්වාසී යහළුවන්ගේ නම් ටයිප් කර ඔවුන් තෝරාගෙන **confirm** බොත්තම මත ක්ලික් කරන්න.

### ඩී ඇක්ටිවේෂන් නොහොත් අක්‍රිය කිරීම

ඔබ වාහනයක් පැදවීම පුහුණු කරන පුද්ගලයෙකුට පලමුව කියාදිය යුත්තේ වාහනය නවත්වා ගන්නා ආකාරයයි.වාහනයක් පැදවීම හා ෆේස්බුක් පාවිච්චි කිරීම එකිනෙකට වෙනස් ක්‍රියාවන් දෙකක් වුවත්,ඔබේ ගිණුම අක්‍රිය කරන ආකාරය ඉගෙන ගෙන සිටීමත් වැදගත් වේ.





- Deactivate your account නම් සම්බන්දකය මත ක්ලික් කරන්න. ඔබේ ගිණුම අක්‍රිය කිරීම සඳහා හේතුවක් ඉල්ලා සිටීවී. ඔබ කැමති තෝරාගැනීමක් සිදු කරන්න.
- එවිට ඔබෙන් ඔබේ මුර පදය (Password) ඉල්ලා සිටීවී. එය ඇතුලත් කිරිමෙන් පසු ඔබේ ගිණුම තාවකාලිකව අක්‍රිය වේවී.
- ඔබේ ගිණුම යළි ක්‍රියාත්මක කිරීම සඳහා නැවත ෆේස්බුක්හි මුල් පේජයට ගොස් පෙර පරිදි ඔබේ ඊ මේලය හා මුරපදය ඇතුළත් කරන්න.

## වයිබර් අංකයන් අවහිර කරන්නේ කෙසේද?


ඔබට වයිබර්හි සිටින කිසියම් අයෙක්ගෙන් පැමිණෙන කෙටි පණිවිඩ හෝ ඇමතුම් නැවැත්වීමට අවශ්‍යය නම් ඔබ කල යුතු වන්නේ ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ අංක block කිරීම හෙවත් අවහිර කර දැමීමයි.

එසේ කිරීමට පහත සඳහන් පිලිවෙත අනුගමනය කරන්න.

- ඔබේ වයිබර් මෘදුකාංගය විවෘත කර ගන්න.





- ඔබේ දුරකතන ස්ක්‍රීනයේ දකුණුපස කෙළවරට වන්නට තිබෙන මෙනුව ස්පර්ෂ කරන්න.





- Settings නම් සැකසුම් සමූහය තෝරා ගන්න.





- එම මෙනුවේ ඇති Privacy නම් සැකැස්ම තෝරාගන්න.




- දැන් Block list ලෙසට ඇති තීරුව විවෘත කර ගන්න.




- ස්ක්‍රීනය පල්ලෙහාට වන්නට ඇති **+ Block number** නම් තීරුව ස්පර්ෂ කරන්න. දැන් ඔබට enter name or number ලෙසින් කොටුවක් දර්ශනය වේවි. ඔබට අවහිර කිරීමට අවැසි අංකය ඒ මත යොදා block number නම් තීරුව ස්පර්ෂ කරන්න.





- ඔබට අවහිර කරන ලද අංක කළමනාකරණය කිරීමට අවශ්‍යය නම් block list වෙත යැමට ඔබ අනුගමනය කරන ලද පියවරයන්ම අනුගමනය කරන්න.

## වට්ස්ඇප් අංක අවහිර කරන්නේ කෙසේද?


එම පිළිවෙත වයිබර් වල අංක අවහිර කරන ක්‍රමයට බෙහෙවින් සමාන වේ.එහෙත් දැනටම ඔබේ දුරකතනයට ඇතුලත් කර ඇති හා නැති දුරකතන අංක අවහිර කිරීමට වට්ස්ඇප් හී ක්‍රමවේදයන් දෙකක් ඇත.

❖ දැනටම ඔබේ දුරකතනයට ඇතුළත් කර ඇති අංක අවහිර කිරීම සඳහා පහත පින්තූර වල ඇති ක්‍රමවේදය භාවිතා කරන්න.





- Button > Settings > Account > Privacy
- ඊළඟට Blocked Contacts නම් තීරුව ස්පර්ෂ කරන්න.

- ඉන් පසුව ඔබට දර්ශනය වන ස්ක්‍රීනයේ දකුණුපස කෙළවරට ඉහලින් එකතු කිරීමේ ලකුණක් සමග ඇති පින්තූරය ස්පර්ෂ කරන්න.
- ඊට පසුව ඔබට අවහිර කිරීමට අවැසි අංකය තෝරා ගන්න.




❖ නොදන්නා අංක අවහිර කිරීම සඳහා එවැනි අංක වලින් ඔබ අමතනු ලැබූ විට සරලව block නම් බොත්තම ස්පර්ෂ කරන්න.



# සිටිසන් ලංකා පරිශීලක අත්පොත

## ඇරඹුම

**සිටිසන් ලංකාහි හැඳින්වීම**

මෙම වෙබ් අඩවිය සකස් කර ඇත්තේ ප්‍රධාන වශයෙන් කොටස් හතරකින් සමන්විත තොරතුරු සන්නිවේදනයක් සඳහා වේ. ඒවා නම් පුරවැසි සභා, භාෂා සමානාත්මතාවය, ශ්‍රී ලංකාවේ නීතිරීති හා ව්‍යවස්ථා සම්පාදනයයි.

**පුරවැසි සභා**

වෙබ් අඩවියේ මෙම කොටස පිරික්සීම මඟින් ඔබට දිවයින පුරා ව්‍යාප්ත වී ක්‍රියාත්මක වන පුරවැසි සභාවන්හි නව්‍ය යාවත්කාලීන (Update) කිරීම් දැනගැනීමට හැකිවනු ඇත. එසේ ම ඔබගේ පුරවැසි සභාව මෙන් ම එහි නවතම තොරතුරු දැකගත හැකි ය.

**භාෂා සමානාත්මතාවය**

වෙබ් අඩවියේ මෙම කොටස ඔස්සේ ඔබට වත්මන් ශ්‍රී ලංකාව මුහුණ දී තිබෙන භාෂාමය ගැටළු දැක ගැනීමටත් ඒ සම්බන්ධව පවතින සියලු දුක්මුසු තත්වයන් කියවා බලා තේරුම් ගැනීමටත් හැකියාව ලැබේ. මෙම කොටසෙහි ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවාසී ජනතාවට මෙරටෙහි පවතින භාෂා අර්බුධයන් ගැන පැහැදිලි දැනුමක් ලබා දී එවායින් මිදී සියලු භාෂාවන්ට එක හා සමාන අයිතිවාසිකම් ලැබෙන ආකාරයේ සහන සලසා දීමයි. ද්වි භාෂා ප්‍රතිපත්තිය වඩාත් සාර්ථකව ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කටයුතු කිරීම මේ මගින් සිදු වේ.

**ශ්‍රී ලංකාවේ නීතිරීති (අධිකරණ මධ්‍යස්ථාන)**

මෙම කොටස පිරික්සීම මඟින් ඔබට ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ එදිනෙදා ජීවිතයට අදාළ වන නීතිරීති සම්ප්‍රදායන් ගැන තොරතුරු දැන ගැනීමටත් තමන්ගේ අයිතිවාසිකම් ගැන දැනුවත් වීම තුළින් පාලකයන්ගේ අයුතු නීති විරෝධී ක්‍රියාවන් හමුවේ දැනුමැති ප්‍රජාවක් ලෙස ඒවාට නැඟී සිටීමටත් හැකියාව ලැබේ. එමඟින් ඔබටද දේශය විනාශ වී යාම අවම කරලීමට දායක විය හැකිය.

මෙම ව්‍යවස්ථාවන් මේ ආකාරයට වර්ග කර දැක්විය හැකිය. එනම් කම්කරු ව්‍යවස්ථා නොහොත් සේවා අයිතිවාසිකම්,පවුල් ව්‍යවස්ථා හෙවත් ගෘහස්ථ හිංසනය, ඉඩම් ව්‍යවස්ථා හෙවත්නිවාස අයිතිවාසිකම්,පාරිසරික ව්‍යවස්ථා, භාෂා අයිතිවාසිකම්, මානව හිමිකම්, අපරාධ ව්‍යවස්ථා, මහජන ව්‍යවස්ථා හා ජාත්‍යන්තර ව්‍යවස්ථා වේ.

**ව්‍යවස්ථා සම්පාදනය**

මෙම කොටස පිරික්සීම ඔස්සේ දේශයේ පුරවැසියන්ගේ අභිවෘද්ධිය පිණිස සිදුකෙරෙන්නා වූ සියලු ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන්ගේ නව්‍ය යාවත්කාලීන කිරීම් ඔබට දැකගත හැකි වනු ඇත.

## වෙබ් අඩවියට පිවිසෙන්නේ කෙසේද?

- පහතින් දී ඇති වෙඩ් අඩවියේ ලිපිනය උද්ධෘත සලකුණු රහිතව (“”) ඔබේ වෙබ් බ්‍රවුසරය මත ටයිප් කරන්න.

  “citizenslanka.org”

- එය තුළට පිවිසීමේදී ඔබට සිටිසන් ලංකා වෙබ් අඩවියෙහි මුල් පිටුව දැකීමට ලැබෙනු ඇත.
- සිංහල, ඉංග්‍රීසි හෝ දෙමළ ලෙසින් ඔබ කැමති භාෂාවක් දී ඇති කොටු තුනෙන් එකක් මත ක්ලික් කර තෝරාගන්න.
- වෙබ් අඩවියේ ඇති සියලු දෑ ඔබට දිස්වන්නේ ඔබ තෝරාගනු ලබන භාෂාවේ ඇති ආකාරයටයි.

**තීරු හා එවායේ ඇති දෑ**

**මුල් පිටුව (Home)** – මේ මත ක්ලික් කිරීමෙන් ඔබ ව නැවතත් වෙබ් අඩවියේ මුල් පිටුව වෙතට යැවේ.
**අපි ගැන (About Us)** – මේ මත ක්ලික් කිරීමෙන් ඔබට අපගේ දැක්ම සහ මෙහෙයුම ඇතුළුව අප සංවිධානයේ විස්තර කියැවීමට පුළුවන් වේ.
**යාවත්කාලීන (Updates)** – අප රට හා පුරවැසියන් සම්බන්ධව මෑත කාලයේදී මතුව ඇති ගැටලු ගැන අප කරන ලද වැඩසටහන් වල යාවත්කාලීන කිරීම් මෙම තීරුව ක්ලික් කිරීමෙන් ඔබට ඇසිය හැකිය.
**විමසන්න (Contact)** – මෙමඟින් ඔබට අප හා සම්බන්ධ වන ආකාරය ගැන විස්තර ලබා ගත හැකිය. අප සිටිනා ස්ථානය සිතියමක් මත අපගේ ලිපිනයද සමඟ දක්වා ඇත.තවද ඔබගේ සම්බන්ධීකරණ තොරතුරු සමඟින් අප වෙතට පණිවිඩයක් එවීම සඳහා පොරමයක්ද මෙම කොටස තුළ ඇත.
**පුරවැසි සභා (Citizens Councils)** – මෙම තීරුව ක්ලික් කිරීම තුළින් ඔබට දිවයින පුරා පැතිරී පවතින පුරවැසි සභා වලට අදාල තොරතුරු කියවා බෙදාගත හැකිවේ.විවිධාකාර විෂයන් බොහොමයක වැදගත් තොරතුරු මෙහි අන්තර්ගත වේ.එනම්*යහ පාලනය, පරිසරය, කාන්තා හා ළමා, තරුණ කටයුතු,*භාෂා හා සංස්කෘතික හා රාජ්‍ය *නිළධාරීන්ගේ වගකීම.* මෙහිදී එබ විසින් එවන ලද ඔබේ පුරවැසි සභාවට අදාළ තොරතුරු ද ඔබට දැක ගත හැකි ය.
**භාෂා සමානාත්මතාවය (Language Equality)** – මෙම තීරුව මත ක්ලික් කිරීමෙන් ඔබට පරිපාලනයට, තොරතුරු ලබා ගැනීමට, අධ්‍යාපනය ලබාගැනීමට හා යුක්තිය ලබා ගැනීම වැනි එදිනෙදා ජීවිතයේ ක්‍රියාකාරකම් වලට භාෂාමය අර්බුධයන් නිසා ඇති වී තිබෙන ගැටලු බලා ගැනීමට පුළුවන් වේ.
**ව්‍යවස්ථා සම්පාදනය (Constitution Making)** – මේ මත ක්ලික් කිරීම තුලින් ඔබට ව්‍යවස්ථා සම්පාදනය හා සම්බන්ද සියලු නව්‍ය යාවත්කාලීන කිරීම් බැලීමටත් ඒවා සම්බන්දයෙන් ඔබේ අදහස් ප්‍රකාශ කර සිටීමටත් පුළුවන් වේ.
**සොයන්න (Search)** – පේජයේ දකුණුපස කෙළවරට ඉහලින් ඇති සෙවීමේ අයිකනය මත ක්ලික් කිරීමෙන් අලුත් පේජයක් විවෘත වී සෙවීම් කොටුවක් දැකීමට හැකි වේ. ඒ මත ඔබ කැමති මාතෘකාවක් ටයිප් කර ඒ පිලිබඳව විස්තර ලබා ගත හැකිය.
**ශ්යාර් බොත්තම් (Share Buttons)** – සෑම පෝස්ටුවක් යටම තිබෙන ෆේස්බුක්, ටිවිටර් හා ගුගල් ප්ලස් අයිකන මත ක්ලික් කිරීම ඔස්සේ ඔබට සිටිසන් ලංකා වෙබ් අඩවියේ තිබෙන එම පෝස්ටු පෙර කී සමාජ වෙඩ් අඩවි මත පලකිරීමට හැකිය. එහිදී ඔබ විසින් පුරවැසි ලංකා වෙබ් අඩවියට එවන ලද ලිපියක් වුව ද ෂෙයා කළ හැකි ය.


# රියල් ටයිම් යුනිකොඩ කන්වටරය

### යුනිකොඩ කන්වටරයක් යනු කුමක් ද?

යුනිකොඩ කන්වටරයක් යනු අන්තර්ජාලයේ භාවිතා කිරීමට හැකි වන පරිදි අකුරු සකස් කරන මෘදුකාංගයකි. මෙම ක්‍රියාවලිය සඳහා වචන ටයිප් කරන්නා ඉංගිරීසියෙන් වචන ටයිප් කරයුතු වේ.

ඉංග්‍රීසි අකුරෙන් සිංහල හෝ දෙමළ වචන උච්චාරනය කරන අන්දම ටයිප් කර යුතු ය. එය එස් එම් එස් භාෂාවට සමාන වේ. මෙම කන්වටරය භාවිත කරන්නා ඉංග්‍රීසි අකුරු සහ එම අකුරු උච්චාරනය වන විදිය හොඳින් දැනගත යුතු වේ.


- පලමුව ඔබගේ වෙබ් බ්‍රවුසරයට ගොස් මෙසේ ටයි කර සොයන්න. “Real Time Unicode Coverter”
- ඔබට පින්තුරයේ දක්වා අති අන්දමට බ්‍රයුසරයේ දිස් වේවි.




ලින්කුව ක්ලික් කර සැනෙන් ඔබව එම වෙබ් අඩවියේ මුල් පිටුවට පිවිසෙනු ඇත.



- ඔබ කැමති භාෂාව තොරා ගන්න. ඔබට කන්වර්ට් කර ගැනීමට අවැසි වන්නේ සිංහලට නම් “Sinhala Unicode” තෝරා ගන්න. ඔබට කන්වර්ට් කර ගැනීමට අවැසි වන්නේ දෙමළට නම් “Tamil Unicode”
තෝරා ගන්න..
- ඉහත ඇති කොටුවේ ඉංග්‍රිසියෙන් ඔබට කන්වර්ට් කර ගැනීමට කැමති වචන ටයිප් කරන්න. එයට අදල යුනිකොඩය පහල කොටුවෙන් දිස් වේවි.
- ඔබ ටයිප් කර නිම වුවා පසුව “ Copy” බොත්තම ක්ලික් කරන්න



# ඇගයීම් පත්‍රය

**ඔව්** හො **නැත** සලකුනු කරන්න. (ඔව් නම් (✓) ද නැත නම් (✕) ද යොදන්න)

1. සරල ලෙසින් අන්තර්ජාලය පිරික්සන්නට හැකියාව ලබාගෙන ඇත. ☐
2. ජී මේල් ගිණුමක් සාදගෙන ඇත. ☐
3. ලැබී ඇති ඊ මේල් බැලීමටත්, ඊ මේල් යැවීමටත් තේරුම් ගෙන ඇත. ☐
4. සමාජ ජාල භාවිතා කිරීමේ අරමුණ හඳුනා ගෙන ඇත. ☐
5. ෆේස්බුක් ගිණුමක් සාර්ථකව සාදගෙන ඇත. ☐
6. ෆේස්බුක් ගිණුමට ප්‍රොෆයිල් පින්තූරයක් අප්ලොඩ් කරගෙන ඇත. ☐
7. ෆේස්බුක් ගිණුමට යාලුවන් එකතු කර ගැනීමට ඉගෙන ගෙන ඇත. ☐
8. ෆේස්බුක් ගිණුමට පොස්ටුවක් සාද පල කර ඇත. ☐
9. ෆේස්බුක් ගිණුමේ යහලුවන්ට පණිවුඩ යැවීමට ඉගෙන ගෙන ඇත. ☐
10. වට්ස් ඇප් සහ වයිබර් භාවිතා කිරීමට සරලව ඉගෙන ගෙන ඇත. ☐
11. අන්තර්ජාලය භාවිතා කරන විට පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව ගැන පියවර ගැනීමේ වටිනාකම වටහාගෙන ඇත. ☐
12. අන්තර්ජාලය භාවිතා කරන විට නාදුනන පුද්ගලයන්ගේ ගොදුරක් බවට පත් වීමේ හැකියාව අවම කර ගැනීමට ඉගෙන ගෙන ඇත. ☐

13. කලින් සාදගත් ජි මේල් ගිණුමට ආරක්ෂාව සපයාගෙන ඇත. ☐

14. කලින් සාදගත් ෆේස්බුක් ගිණුමට ආරක්ෂාව සපයාගෙන ඇත. ☐

15. වට්ස් ඇප් සහ වයිබර් හී අනවශ්‍ය නොම්බර බ්ලොක් කිරීමට ඉගෙන ගෙන ඇත. ☐

16. පුරවැසි ලංකා වෙබ් අඩවියේ අරමුණ වටහ ගෙන ඇත. ☐

17. පුරවැසි ලංකා වෙබ් අඩවියට පිවිසෙන අන්දම ඉගෙන ගෙන ඇත. ☐

18. තොරතුරු සඳහා අන්තර්ජාලය පිරික්සීමට ඉගෙන ගෙන ඇත. ☐

19. සිවිල් වාර්ථා දෙකක් පුරවැසි ලංකා වෙබ් අඩවියට එවීමට හැකි විය. ☐

20. පුරවැසි ලංකා වෙබ් අඩවියෙන් පැවැත් වු කැම්පෙනයක් සඳහා සාර්ථකව සහභාගි වී ඇත. ☐

